(79)

23 AUG 2005

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2005 අංක 18 දරන පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 ජූනි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ජූනි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ "රුපියල් දෙදහස් පන්සියයට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට", යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම.

30. (1) මේ පනතේ විධිවිධාන සන්නද්ධ හමුදා මගින්, පොලිස් බලකාය මගින්, රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් හෝ පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා සඳහා හෝ ඔහු වෙනුවෙන්, දරනු ලබන පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් පුපුරණ ද්‍රව්‍ය පැටවීම සහ බෑම, ප්‍රවාහනය කිරීම සහ ගබඩා කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියමයක, යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ විධිවිධානයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2005 අංක 18 දරන පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 ජූනි මස 13 වන දින]

එල්. ඩී.-ඕ. 34/2000.

## පුපුරණ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2005 අංක 18 දරන පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

183 වන අධිකාරයේ 2 වන සහ 3 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුපුරණ ද්‍රව්‍ය පනතේ 2 වන සහ 3 වන වගන්ති මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

"පුපුරණ ද්‍රව්‍ය පාලක, නියෝජ්‍ය පාලකවරු, සහකාර පාලකවරු.

2. (1) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයා පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා විය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යාංශයේ සෑම අතිරේක ලේකම්වරයකුම සහ සෑම ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුම නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකවරයකු විය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යාංශයේ සෑම සහකාර ලේකම්වරයකුම, සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරයකු විය යුතු ය.

(4) මේ පනතේ කාර්ය සඳහා නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකවරුන් හෝ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරුන් වශයෙන් හෝ එසේ කටයුතු කිරීමට යම් තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

පරීක්ෂකයන් හා වෙනත් කාර්ය මණ්ඩල.

3. (1) මේ පනතේ කාර්ය සඳහා සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන සෑම පොලිස් නිලධරයකුම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරයකු විය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.".

2-P E 000194-4,500 (2005/03)